ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 18/05/2021 |

පැමිණිලි පාර්ශවය : පී. විජේසූරිය මිය.
අංක : 126/3, සමුපකාර ඉඩම,
දික්ඔවිට, හැඳල.

වගඋත්තරකරුවන් : ස්ථානාධිපති,
අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
හෝමාගම.

<u>**පැමිණිලි අංකය : HRC/53/17**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, රන්දික රුක්ෂාන් වන තම පුතාව 2017.0102 වන දින සොරකමක් සම්බන්ධයෙන් සැකපිට හෝමාගම පොලිසියට භාරදුන් බවට තමාට එදින රාත්‍රියේ 1.30 ට පමණ දුරකථන ඇමතුමක් මගින් දැනගැනීමට ලැබුනු බවත්, ඒ අනුව 2017.01.03 වන දින තම දියණිය සමග පුතා බැලීමට හෝමාගම පොලිස් ස්ථානයට ගිය බවත්ය. එහිදී පොලිස් නිලධාරින් තමාට පරුෂ වචනයෙන් බැණ වැදුනු බවත්, තමා පොලිසියට යනවිට තම ලේලිය වන දිල්කි යන අය ද පොලිස් ස්ථානයේ සිටි බවත්, ඇයට ද පොලිසියෙන් පහරදී ඇති බවත්, පසුව ඇයව සවස නිදහස් කළ බවත්, පැමිණිලිකාරියව පොලිසියේ තබාගෙන පසුදින එනම්, 2017.01.04 දින අධිකරණයට ඉදිරිපත් කර ඇප ලබාදුන් බවත් සදහන් කර ඇත. නමුත් තම පුතාව 2017.01.07 දින දක්වා අමානුෂික අන්දමින් පහරදී පොලිස් ස්ථානයේ රදවා තබා ගත් බව වැඩිදුරටත් සදහන් කර ඇත.

මෙම කරුණු සම්බන්ධයෙන් 2017.01.06 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණ දැනුම්දීමෙන් පසුව 2017.01.07 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, මානව හිමිකම් කොමිෂන් සභාවේ පවතින පැමිණිල්ල ඉල්ලා අස් කර ගන්නා ලෙසට තර්ජනය කළ බවත්, පුතාට පහරදීම නිසා වැලිකඩ බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවත් වැඩිදුරටත් සදහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිල්ල තහවුරු කිරීම සඳහා ඉදිරිපත් වී ඇති සාක්ෂි :-**

සෙවනගල, කිරිවැව, අංක : 73 ලිපිනයෙහි පදිංචි දිල්කි මධුමාලි යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2017.01.02 දින සවස 4.00 ට පමණ තමා පදිංචිව සිටින නිවසට පොලිස් කාන්තාවක් සමග පොලිස් නිලධාරියෙකු පැමිණ තමාව පොලිස් ස්ථානයට රැගෙන යා යුතු බවට සඳහන් කළ බවත්, ඊට හේතුව රන්දික යන අය මාල සොරකමක් කර එම මුදල් තමාගේ බැංකු ගිණුමේ තැන්පත් කර ඇතැයි ප්‍රකාශ කිරීම බවත් සඳහන් කර ඇත. පසුව තමාව හෝමාගම පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, එදින රාත්‍රියේ පොලිසිය තුළ කිසිදු කාන්තා නිලධාරිනියක් නොසිටි බවත්, තමාව වැසිකිලියට රැගෙන ගියේ ද පොලිස් නිලධාරින් බවත් සඳහන් කර ඇත. එදිනම රාත්‍රියේම රන්දික පොලිස් ස්ථානයට පැමිණි බවත්, එවිට ඔහුව සිර මැදිරියට දැමූ බවත් සඳහන් කරන අතර, සොරකම භාරගන්නා ලෙසට බල කරමින් තමාට ද පහරදුන් බවද සඳහන් කර ඇත. පසුදින තමාගෙන් කටඋත්තරයක් ගෙන තමාව නිදහස් කළ බවත්, රන්දිකට පහරදී පොලිස් ස්ථානයේ රඳවා තබා ගත් බවත්, පසුව අධිකරණයට ඉදිරිපත් කර බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

හෝකන්දර, නැගෙනහිර හෝකන්දර අංක : 70 ලිපිනයේ පදිංචි පියුමි යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ තම සහෝදරයා 2017.01.02 දින දුරකථන ඇමතුමක් දී ඔහු හෝමාගම පොලිසියට භාරවන බවට සඳහන් කළ බවත්, එමනිසා 2017.01.03 වන දින තම මව සමග හෝමාගම පොලිසියට ගිය බවත්ය. පොලිස් ස්ථානයේදී ඔවුන්ට බැණ වැදුනු බවත්, තම මව පොලිසියේ රඳවා තබා ගත් බවත්, එම අවස්ථාවේදී සහෝදරයා ද පොලිසියේ සිටි බවත් සඳහන් කර ඇත. තම සහෝදරයා ඔහුට පහරදුන් බවට තමාට ප්‍රකාශ කළ බව ද, ඒ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව පැමිණිලි කළ බව ද, එසේ පැමිණිලි කිරීම නිසා පොලිසියෙන් තමාට තර්ජනය කළ බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේම, 2017.01.07 වන දින තම සහෝදරයාව අධිකරණයට ඉදිරිපත් කළ බවද දක්වා ඇත.

වින්දිත පුද්ගලයා වන රන්දික රුක්ෂාන් යන අය සම්බන්ධයෙන් බන්ධනාගාර රෝහලෙන් වෛද්‍ය වාර්තාවක් කැඳවා ඇති අතර, එහි සඳහන් වන්නේ කකුල් දෙක ඉදිමී ඇති බවත්, එහි තැලීම් තුවාල ඇතත්, පෙනෙන්නට වෙනත් තුවාල නොමැති බවත්ය.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකාර පො.ප. ජේ.කේ.පී. හේවගේ මහතා, ස්ථානාධිපති, අපරාධ අංශය, හෝමාගම පොලිස් ස්ථානය විසින් ප්‍රකාශ කර ඇත්තේ, චින්තක රුවන් සම්පත් යන අය 2016.12.16 දින පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් තමා සතු මුදල් සහ ජංගම දුරකථන සොරකම් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන්

රන්දික සහ ක්‍රිස්ටෝපර් යන පුද්ගලයන් සම්බන්ධ වී ඇති බවත්, එම මුදල් රන්දික යන අයගේ බිරිදට ලබාදී ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව 2017.01.03 වන දින කාන්තා පොලිස් නිලධාරිනියක් සමග පොලිස් නිලධාරීන් කණ්ඩායමක් කිරිඉබ්බන්වැව ප්‍රදේශයේ දී පැය 18.50ට ඉහත සොරකම සම්බන්ධයෙන් සැකපිට නාලක නිරෝෂන් කුමාර යන අයව අත්අඩංගුවට ගෙන පැය 20.30 ට සොරකමකට අනුබලදීම සම්බන්ධයෙන් දිලිනි මධුමාලි යන අයද අත්අඩංගුවට ගෙන හෝමාගම පොලිස් ස්ථානයට රැගෙන ආ බවට සඳහන් කර ඇත. අත්අඩංගුවට ගත් සැකකාරිය කරන ලද ප්‍රකාශය අනුව '2016.12.13 වන දින රන්දික හා ක්‍රිස්ටෝපර් යන අය තම නිවසට පැමිණ ජංගම දුරකථන දෙකක් සහ තවත් පාර්සලයක් දුන් බවත්, එහි මුදල් තිබූ බවත්, එම මුදල් එනම් රු. ලක්ෂයක් රන්දිකගේ අම්මාට දුන් බවත්' ප්‍රකාශ කර ඇත. ඒ අනුව රන්දික යන අයගේ මවට ද පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දැන්වීමෙන් පසුව 2017.01.04 වන දින පැය 18.30 ට වීරසූරිය ආරච්චිලාගේ දොන් ප්‍රසාන්ති යන අයව සොරකම් කරන ලද මුදල් සාපරාධී සාවද්‍ය පරිහරණය යන චෝදනාව යටතේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවත්, පසුව 2017.0106 වන දින පැය 13.50 ට නිවසක් බිඳ මුදල් සහ ජංගම දුරකථන සොරකම් කිරීම යටතේ රන්දික රුක්ෂාන් යන අයව අත්අඩංගුවට ගැනීම සඳහා හෝකන්දර ප්‍රදේශයේ සංචාරය කරන අවස්ථාවේදී සැකකරු පොලිසිය දැක බේරී පලායාම සඳහා බොරළු පාරක් දිගේ දිව යාමේදී පය පෙරළී කිහිප අවස්ථාවකදී බිම ඇද වැටුනු බවත් සඳහන් කර ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සතුව සොරකම් කරන ලද ජංගම දුරකථන දෙකක් තිබී සොයා ගන්නා ලද බවත්, පසුව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

හෝමාගම පොලිසිය විසින් තොරතුරු සටහන් පොත් වල උද්ධෘත සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහිදී 2016.12.16 වන දින මුදල් හා ජංගම දුරකථන සොරකම් කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලේ සටහන්ව ඇති බව දක්නට ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ලට අනුව පැමිණිලිකාරිය වන ප්‍රසාන්ති විජේසූරිය යන අයව 2017.01.03 දින අත්අඩංගුවට ගෙන 2017.01.04 දින අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, දිල්කි මධුමාලි යන අයව 2017.01.03 වන දින අත්අඩංගුවට ගෙන ප්‍රකාශයක් සටහන් කර එදිනම මුදා හැර ඇති බවත්, රන්දික රුක්ෂාන් යන අයව 2017.01.03 වන දින අත්අඩංගුවට ගෙන 2017.01.07 වන දින අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය සහ ඇයගේ පුතා වන රන්දික රුක්ෂාන් යන අයට විරුද්ධව නඩු අංක 07079/16 යටතේ හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ සොරකම් කිරීම සහ සොරකම් කරන ලද භාණ්ඩ සාවද්‍ය පරිහරණය කිරීම යටතේ නඩුවක් ගොනු කර ඇති අතර, දිලිනි මධුමාලි යන අයව එම නඩුවේ සාක්ෂිකාරියක් ලෙස ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් වලට අනුව පැමිණිලිකාරියව අත්අඩංගුවට ගත් දිනය සහ පැමිණිල්ලේ සඳහන් වන දිනය එකම දිනයක් බවට නිරීක්ෂණය වේ. නමුත්. රන්දික රුක්ෂාන් යන අයව වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ වලට අනුව සඳහන් වන්නේ 2017.01.06 වන දින අත්අඩංගුවට ගත් බවයි. නමුත් පැමිණිලිකාරිය පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ. 2017.01.03 වන දින රන්දික රුක්ෂාන් යන අයව අත්අඩංගුවට ගත් බවයි. පැමිණිල්ලට අදාලව ඉදිරිපත් කර ඇති අනෙකුත් අනෙකුත් දිවුරුම් ප්‍රකාශ වලද 2017.01.03 වන දින රන්දික රුක්ෂාන් යන අයව අත්අඩංගුවට ගෙන ඇති බවට දක්වා තිබීම තුලින් අදාල අත්අඩංගුවට ගැනීම එදින සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

තවද. සැකකාර රන්දික රුක්ෂාන් යන අයව අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී පැමිණිලිකාර පාර්ශවය රන්දික රුක්ෂාන යන අයව දින 05 ක් රඳවා තබාගෙන සිටි බවට මහේස්ත්‍රාත්වරයාට දැනුම්දී ඇති බව ද නිරීක්ෂණය වේ.

බන්ධනාගාරයේ ප්‍රධාන වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාව අනුව රන්දික රුක්ෂාන් යන අය බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබාගෙන ඇති අතර. ඔහුගේ කකුල ඉදිමී තිබූ බවත්. සීරීම් තුවාල ඇති බවත් සඳහන් වී ඇති බැවින්. වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදුකර ඇති බවටද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලේ අගතියට පත් අයෙකු වන රන්දික රුක්ෂාන් යන අයට කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන ලෙසත්. සිද්ධිය සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසත් පැමිණිලිකාරිය මාර්ගයෙන් දන්වා ඇතත්. ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැති බවට නිරීක්ෂණය වේ. නඩු වාර්තාවට අනුව නඩු භාණ්ඩ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියව ද අත්අඩංගුවට ගැනීමෙන් පසුව සොරකම් කරන ලද මුදල් රු. ලක්ෂයක් සාවද්‍ය පරිහරණය කල බවට චෝදනා ගොනු කර අධිකරණයට ඇති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තා අනුව සහ ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ අනුව රන්දික රුක්ෂාන් යන අයට වගඋත්තරකරුවන් විසින් පහරදී ඇති බවට තහවුරු වන අතර. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති රන්දික රුක්ෂාන් යන අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුවී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු</u> නඩුවේ දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම. 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත

වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

__ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත__ නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තීව්‍ර කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හා අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතු බවත්, එසේම සෑමවිටම නීතිය බලාත්මක කරන නිලධාරින් නීතියට කීකරුවීමට සහ ඒවා පිළිපැදීමට සහතික විය යුතු බවයි.

__වේලමුරුගේසු එදිරිව නීතිපතිවරයා සහ තවත් අය__ නඩුවේදී වනසුන්දර විනිසුරුතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළ නිර්දේශ දක්වා ඇත. වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව ලබාදෙන 11 වන ව්‍යවස්ථාවේ වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක් ද අවශ්‍ය වන බැවින් මෙම 11 වන ව්‍යස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අතිවාසිකමෙහි වැදගත්කම තවදුරටත් සුවිශේෂත්වයක් පෙන්නුම් කරයි.

එසේම රන්දික රුක්ෂාන් යන අයව 2017.01.03 වන දින අත්අඩංගුවට ගෙන 2017.01.07 වන දින අධිකරණයට ඉදිරිපත් කර ඇති බැවින් දින 04 ක් පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන ඇති බවට තහවුරු වේ. ඒ අනුව 1978 අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව අනුව යම් පුද්ගලයෙක් රඳවා තබා ගත යුත්තේ නීතියෙන් නියම කර ඇති ආකාරයට වන අතර, එසේ නොවන්නේ නම් එය නීතිවිරෝධි රඳවා තබාගැනීමක් වේ. එනම්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 37 වන වගන්තිය අනුව වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත් තැනැත්තෙකු අවස්ථානුකූල වූ සියළු කරුණු වලට අනුව යුක්ති සහගත කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවේ තබා ගැනීමට හෝ අන් ලෙසකින් රඳවා තබා ගැනීම කිසියම් සාම නිලධාරියෙක් නොකළ යුතු බවට දක්වා ඇත. එසේම රඳවා තබා ගත හැක්කේ අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කරන කාලය සහ පොලිස් ස්ථානයේ සිට මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ගෙන යාමට ගත වන කාලය ඉවත් කර පැය 24 ක් නොඉක්මවන කාලයක් තුළ බවද දක්වා ඇත. ඒ අනුව රන්දික රුක්ෂාන් යන අයව සාමාන්‍ය නීතිය යටතේ අත්අඩංගුවට ගෙන පැය 24 කට වඩා රඳවා තබා ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති මූලික අයිතිවාසිකම ද උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැමිණිල්ලේ සඳහන් වන කරුණු වලට අනුව ඇයට පහරදීමක් සම්බන්ධයෙන් සඳහන් නොවන අතර, ඇයව පැය 24 ක කාලයක් තුළ අධිකරණය

වෙත ඉදිරිපත් කර ඇති බවට කරුණු නිරීක්ෂණය වන බැවින් ද. ඇයට විරුද්ධව මේ වනවිට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වන බැවින්ද ඇයගේ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලභාවය පිළිබඳව නිර්දේශයක් නිකුත් කිරීමට හැකියාවක් නොමැත.

**නිර්දේශය =:**

01. ඒ අනුව රත්දික රුක්ෂාන් යන අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් රත්දික රුක්ෂාන් යන අයට රු. 25,000/- ක මුදලක් ලබාදිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

02. තවද, වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරන බවද දන්වා සිටිමි.

2021.06.21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/